ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-08-16 |

පැමිණිලිකරු : ජේ.ටී. ග්‍රැන්විල් මයා,
"සුමන" සපුගහවත්ත,
දොඩම්ගොඩ.

වගඋත්තරකරුවන් : සාමාන්‍යාධිකාරී,
මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,
නො: 89, "රන්මග පාය"
කඩුවෙල පාර,
බත්තරමුල්ල.

<u>පැමිණිලි අංක : **HRC/4504/15**</u>

පැමිණිල්ල :-

ඉහත නම් දරණ පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, 2013 වර්ෂයේ නොවැම්බර් මස 08 වන දින මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ (බ.ප) පරිපාලන නිලධාරී (ධාවන) තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණය පෙනී සිට ලද ලකුණු පිළිවෙල අනුව තමා එහි දෙවන ස්ථානයට ස්ථාන ගත වූ බව ප්‍රකාශ කර ඇත. නමුත් එම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව තමා හට පරිපාලන නිලධාරී (ධාවන) තනතුර ලබා නොදුන් බවත් ඒ පිළිබඳව දිගින් දිගටම ලිපි මගින් පාලන අධිකාරිය හා අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කළ බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. කෙසේ නමුත් වගඋත්තරකාර ආයතනයේ මිළගට උද්ගත වන පුරප්පාඩුව සඳහා තමා හට පරිපාලන නිලධාරී (ධාවන) තනතුර ලබා දෙන බව ප්‍රකාශ කළද, 2014.10.25 දිනැතිව ඇති වූ පුරප්පාඩුවටද තමා හට අවස්ථාවක් ලබා නොදුන් බවද සඳහන් කර ඇත.

පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇති සහනය වශයෙන් දක්වා ඇත්තේ 2013.11.08 දිනැතිව පැවැති සම්මුඛ පරීක්ෂණය අනුව තමා හට ලැබිය යුතු පරිපාලන නිලධාරී (ධාවන) තනතුර ලබා ගැනීම වේ.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**2015.01.16 දිනැති සාමාන්‍යාධිකාරී මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (බ.ප) විසින් යොමු කර ඇති වාර්තාව**

වගඋත්තර පාර්ශවය විසින් සිය ලිඛිත කරුණු ඉදිරිපත් කරමින් 2013.11.07 දින පරිපාලන නිලධාරී (ධාවන) සම්මුඛ පරීක්ෂණය සිදු කරන ලද බවත්, ඒ අනුව 2013.12.01 දිනට පත්වීම් ප්‍රධානය කර ඇති බවත් ප්‍රකාශ කර ඇති අතර මෙම පැමිණිල්ල කාලාවරෝධී වී ඇති බවට මූලික විරෝධතාවයක් ද ඉදිරිපත් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු -:**

<u>2016.01.14 පරීක්ෂණය</u>

පැමිණිලිකරු විසින් ප්‍රවාහන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කරන ලද පැමිණිල්ල ප්‍රකාරව මෙම උසස්වීම් ලබා දී ඇති ආකාරය පිළිබඳව සිදුකර ඇති මූලික විමර්ශන වාර්තාවේ අවසාන තීරණයේ පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

සුදුසුකම් නොමැතිව පත්වීම් ලබාදී ඇති නිලධාරීන් පිළිබඳව තීරණයක් ගන්නා ලෙසත් එසේම මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුට සම්මුඛ පරීක්ෂණයේදී අවසාන ප්‍රතිඵලය අනුව පරිපාලන නිලධාරී (ධාවන) තනතුර ලැබීමට සුදුසුකම් පවතින බව අනාවරණය වන බැවින් 2014.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි එම තනතුර ලබා දීමට අපොහොසත් වන්නේ නම් ඒ සඳහා පවතින නීතිමය බාධාවන් මොනවාද යන්න දන්වන ලෙසත් වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත.

<u>2016.03.04 පරීක්ෂණය</u>

පෙර පරීක්ෂණයේදී කොමිෂන් සභාවෙන් ලද උපදෙස් අනුව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට සාමාන්‍යාධිකාරී හා සභාපති වෙත දන්වන ලද නමුත් එම වාර්තාව ඉදිරිපත් කිරීම කළ නොහැකි බව තමා වෙත දැන්වූ බවට වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි නිලධාරියා විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. එසේම 2013.09.30 දිනැති සම්මුඛ පරීක්ෂණයේදී පස්දෙනෙකුට උසස්වීම් ලබා දුන් බවත් උසස්වීම් ලබා දුන් අවස්ථාවේදී පුරප්පාඩු 2 ක් පැවැති බවත් පත්වීම ලබා දෙන අවස්ථාව වන විට පුරප්පාඩු 5 ක් පැවැති හෙයින් පස්දෙනෙකුට උසස්වීම් ලබා දීමට 2013.09.30 දිනැති සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල පාදක කරගත් බවත් වගඋත්තරකරු විසින් දන්වා ඇත.

<u>2016.03.15 පරීක්ෂණය</u>

වගඋත්තරකාර පාර්ශවය විසින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදුන් ලේඛනයේ සහතික කළ පිටපතක්ද පත්වීම් ලබා දුන් නිලධාරීන්ගේ නාම ලේඛනයේ පිටපතක්ද කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු මුලික අයිතිවාසිකම් උල්ලංඝනය සිදුවීමෙන් වසරක කාලයක් ගත වීමෙන් පසුව පැමිණිල්ල ඉදිරිපත් කර ඇති බවට මුලික විරෝධතාවයක් ඉදිරිපත් කර ඇත. නමුත් පැමිණිලිකරු වරින් වර වගඋත්තරකාර පාර්ශවයෙන් තමාට වු අගතිය පිළිබඳව ලිඛිතව සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා ඇති බැවින් පැමිණිලිකරු සාධාරණ උත්සාහයක් ගෙන ඇති බවත් ඒ අනුව පැමිණිලිකරුගේ මුලික අයිතිවාසිකම් උල්ලංඝනය විම අඛණ්ඩව සිදුවී ඇති බව නිරීක්ෂණය කළ හැකි බැවින් වගඋත්තරකරුගේ මුලික විරෝධතාවය පිළිගත නොහැකි බව දන්වා ඇත.

2016.06.26 දිනට පැමිණිලිකරු ඉල්ලා සිටින තනතුරට අදාළ නිලධාරියෙකු විශ්‍රාම යාමට නියමිත බැවින් එදිනට පැමිණිලිකරුට පත්වීම ලබාදීමේ හැකියාවක් පවතින බවට වගඋත්තරකාර පාර්ශවය වැඩිදුරටත් දන්වා ඇත. නමුත් මුල් අවස්ථාවේදි සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු 44 ක් ලබා 02 වන ස්ථානයට පත්ව සිටින පැමිණිලිකරුට එම අවස්ථාවේදි එම තනතුර ලබා නොදිම තුළ උද්ගත ව ඇති අසාධාරණය සඳහා සලසා දිය හැකි සහනය පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයෙන් විමසා ඇති අතර වගඋත්තරකාර පාර්ශවය සඳහන් කර ඇත්තේ කොමිෂන් සභාවේ තිරණය ලබාදිමට කටයුතු කරන ලෙසත් ඒ අනුව සහනය සලසා දියහැකි බවත්ය.

**නිරීක්ෂණ හා නිගමන :-**

2014 සැප්තැම්බර් 18 දිනැති විගණන අධිකාරි විසින් නිකුත් කර ඇති මර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්යය මණ්ඩලය හා අභ්‍යන්තර උසස්වීම් පරීක්ෂාව පිළිබඳ විගණනයේදි පහත කරුණු අනාවරණය වු බව සඳහන් කර ඇත.

1. බඳවා ගැනිම් පරිපාටියේ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා කළමණාකරණ සහකාර I ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්ද ඇති අයගෙන් බඳවා ගත යුතුය යන්න සඳහන් කර තිබු අතර අධිකාරියේ I වන ශ්‍රේණියේ නිලධාරීන් නොමැති වුවද, මෙම තනතුර සඳහා අභ්‍යන්තරව බඳවා ගැනිම් කර තිබු අතර ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයේදි (Structured interview) ලකුණු ලබාගත් අනුපිළිවෙලට තනතුරු ලබාදි නොතිබුණු බවත්,

2. මෙම තනතුරු සඳහා පරිපාලන චක්‍රලේඛ අංක 103 මගින් v,vi හා viii ශ්‍රේණි වල තනතුරු දරන්නන්ට ඉල්ලුම් කරන්නට ඉඩ ලබා දිම නිසා එම තනතුරට ඉල්ලුම් කළ හැකි නිලධාරීන්ට තිබිය යුතු පළපුරුද්ද නිශ්චිත නොවිම මතභේදයට තුඩු දෙන කරුණක් බවට නිරීක්ෂණය කරන බවද දක්වා ඇත.

3. තවද, සේවා අංක 200 හා සේවා අංක 1052 එකම දිනයක එනම් 2009.01.20 දින අදාළ තනතුරු වලට පත්ව තිබුණු බවත් සේවා අංක 210 සඳහා සම්මුඛ පරීක්ෂණ ඇගයිම් පත්‍රවල අවුරුදු පහට මාස 1 1/2 ක් අඩු බව remarks තිරුවේ සටහන් කර තිබු අතර සේවා අංක 1052 සඳහා එකි තනතුර

පිරිනමා තිබීම තුළින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවන පරිදි කටයුතු කර ඇති බව නිරීක්ෂණය කරනු ලබන බවත් දක්වා ඇත.

4. එසේම අංශ ප්‍රධාන ලෙස කටයුතු කර තිබූ සේවා අංක 210 ට අනෙකුත් ජයග්‍රහණ (Other Achievement) සඳහා කිසිදු ලකුණක් ලබා නොදීමටත් අනෙක් අයදුම්කරුවන්ට ලකුණු ලබා දීමටත් වූ හේතු විගණනය වෙත පැහැදිලි නොවූ බවද දක්වා ඇත.

5. සම්මුඛ පරීක්ෂණ ඇගයීම් පත්‍රවල ඉහළ ලකුණු ලබාගත් (සේවා අංක 210, 188, 1008, 1202 හා 1218) අයදුම්කරුවන් සිටියදී පහළ ලකුණු ලබා ගත් සේවා අංක 1119 සහ 1128 ට අදාළ තනතුරු පිරිනමා තිබූ බවද,

6. මීට අමතරව සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් නොවූ අයකු වූ සේවා අංක 423 සඳහා ද මෙකී තනතුරක් පිරිනමා තිබූ බවද දක්වා ඇත.

- 2013.11.07 දිනැති සම්මුඛ පරීක්ෂණයේ ලකුණු සටහන් දෙස අවධානය යොමු කිරීමේදී මහේෂ් නිශාන්ත මහතා ලකුණු 53 ක්ද, තේපා ග්‍රැන්විල් යන මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු ලකුණු 44 ක්ද, ලබා පිළිවෙලින් 1 හා 2 ස්ථාන වලට පත්ව ඇති බව නිරීක්ෂණය වේ. නමුත් පත්වීම් ලබා දීමේදී ලකුණු 53 ක් ලබා ගත් එම්.ඒ. මහේෂ් නිශාන්ත මහතාටද, ලකුණු 40.05 ක් ලබා ගෙන සම්මුඛ පරීක්ෂණ ලේඛනයේ 3 වන ස්ථානයට පත් වූ වි.ආර්. පසුබති මහතාටද, ලකුණු 26.05 ක් ලබා ගනිමින් සම්මුඛ පරීක්ෂණ ලේඛනයේ 6 වන ස්ථානයට ස්ථාන ගතව සිටින ආර්.කේ.ඩී. ගුණවංශ මහතාටද, ලකුණු 24 ක් ලබා ගනිමින් සම්මුඛ පරීක්ෂණ ලේඛනයේ 8 වන ස්ථානයට පත් වූ අජිත් උපාලි ජයවීර මහතාටද, ලකුණු 5 ක් උපයා ගනිමින් සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු පිළිවෙල අනුව 16 වන ස්ථානයට ස්ථාන ගත වූ ඒ.කේ.කේ. පෙරේරා මහතාටද පත්වීම් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

- 2014.11.03 දිනැතිව ප්‍රවාහන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා වෙත ලිපියක් යොමු කරමින් 2013.11.08 දින පැවැති අභ්‍යන්තර බඳවා ගැනීම් සම්මුඛ පරීක්ෂණයට යටත්ව නැවත උසස්වීම් ලබා දීමේ මැයෙන් එම කාරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශය මගින් මූලික විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කර ගෙන යනු ලබන බැවින් 2013.11.08 දින පැවැති සම්මුඛ පරීක්ෂණය අනුව තවදුරටත් ඉදිරි පත්වීම් ලබා දීමට කටයුතු කරන්නේ නම් වහාම එම කටයුතු අත්හිටුවන ලෙසට දන්වා ඇති බව නිරීක්ෂණය වේ.

- 2015.03.31 දිනැතිව ප්‍රවාහන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් විසින් සාමාන්‍යාධිකාරී/සභාපති මාර්ස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලිපියක් යොමු කරමින් බස්නාහිර පලාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පරිපාලන නිලධාරී (ධාවන) තනතුරු සඳහා පත්කිරීම පිළිබඳ මූලික විමර්ශනයේ නිර්දේශ දැනුම් දී ඇති බව නිරීක්ෂණය වේ. එහිදී 2013.11.07 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණය මගින් සිදුකළ පරිපාලන නිලධාරී (ධාවන) තනතුර සඳහා පත්කිරීම් සිදු කිරීමේදී අක්‍රමිකතා සිදුවී ඇති බවට ලැබුණු පැමිණිලි පරීක්ෂා කිරීමෙන් අනතුරුව සිදුකළ පරීක්ෂණයෙන් පසුව පහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බව දන්වා ඇති බව ද නිරීක්ෂණය වේ.

ඒ අනුව,

පරිපාලන නිලධාරී ධාවන තනතුරේ පුරප්පාඩු සඳහා අයදුම්පත්‍ර කැඳවීමේ සිටම විධිමත් පරිදි ක්‍රියාකර නොමැති බවත් සම්මුඛ පරීක්ෂණය මගින් ලබා දුන් පත්වීම් ලකුණු පිළිවෙලට ලබා දී නොමැති බැවින් ඒවා ලකුණු මට්ටම් සලකා අදාළ පත්වීම් නැවත ලබා දීමට නිර්දේශ කර ඇත.

තවද දැනට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පවතින පුරප්පාඩු පිරවීමේදී ලකුණු මට්ටම සලකා බලා අසාධාරණයට ලක් වූ නිලධාරීන්ට ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කිරීමටත් මින් ඉදිරියට පත්වීම් ලබා දීමේදී විධිමත් පරිදි පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් අදාළ කටයුතු සිදු කිරීමටත් නිර්දේශ කර ඇත.

එසේම පත්වීම් ලබා දීමට ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමට හා මේ සම්බන්ධව දින 14 ක් ඇතුළත ක්‍රියාමාර්ග ගෙන ප්‍රගතිය තමා වෙත දන්වා එවන ලෙසද දන්වා ඇති බව නිරීක්ෂණය වේ.

- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පරිපාලන නිලධාරී (ධාවන) තනතුර 2013.11.07 දින පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත පත්වීම් ලබා දීමට වගඋත්තරකරු කටයුතු කර නොමැති බවත් සම්මුඛ පරීක්ෂණයේදී පිළිවෙලට ලකුණු ලබා නොගත් සහ සැළකිය යුතු මට්ටමේද ලකුණු ලබා නොගත් නිලධාරීන් හට පත්වීම් ලබා දීමට වගඋත්තරකරු කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

සමස්තයක් ලෙස ගත් කළ විගණන විමසුමෙන් අනාවරණය වී ඇති කරුණු අනුවද 2015.03.31 දිනැති ප්‍රවාහන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්ගේ මූලික විමර්ශනයේ නිර්දේශ අනුවද මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වගඋත්තරකරු විසින් ඉදිරිපත් කර ඇති සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැයිස්තුව හා පත්වීම් ලබා දී ඇති නිලධාරීන්ගේ නාම ලේඛනයද පරීක්ෂා කිරීමෙන් අනතුරුව වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුළින් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුට පරිපාලන නිලධාරී (ධාවන) තනතුර ලබා ගැනීම සඳහා සුදුසුකම්

තිබියදීත් එම තනතුර ලබා දීමට වගඋත්තරකරු කටයුතු නොකිරීම මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති නීතිය ඉදිරියේ සමාන රැකවරණයක් ලැබීමේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව අනාවරණය වේ.

**නිර්දේශය -:**

01. ඒ අනුව 2014.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම පැමිණිලිකරුට පරිපාලන නිලධාරි (ධාවන) තනතුර සඳහා පත්වීම් ලබා දීමට කටයුතු කරන ලෙසත්,

02. එසේම ඉදිරියේදී හෝ නැවත මෙවන් තත්වයන් උද්ගත නොවන පරිදි කටයුතු කිරීමට වගබලාගත යුතු බවට වගඋත්තරකරු වෙත අවධාරණය කරනු ලැබේ.

2016.09.19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

B/